සැ. යු. - 2011.04.15 දින පළ වූ අංක 1702 දරන ගැසට් පත්‍රයේ I:III (අ) කොටස පළ නොවිය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,703 - 2011 අප්‍රේල් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2011.04.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 872 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 873 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අප්‍රේල් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(vii) යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධන නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වන උප වගන්ති අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

- *(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ
- *(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගාකිරීමට යටත් කර නොමැති විටක හෝ ;
- *(ඇ)* ඒ ඉඩමෙ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10ට 1ට වඩා අඩුවන්නේ නම්.

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2011 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2%) ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2011 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

04-561/7

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(i) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ පළමුවන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් වල හා ගෙපත්වල 2010 වර්ෂයේ වාර්ෂික වරිපනම් 2011 වර්ෂය සඳහා පිළිගැනීමටත් ,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ පළමුවන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් 5%ක සහ 8%ක වරිපනමක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ 06 වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු 04 තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කිරීමටත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

04-561/6

---

## බලන්ගොඩ නගර සභාව

විශේෂ දැන්වීමයි

ලංකා නීති ප්‍රඥප්තියේ 255 අධිකාරිය වූ නගර සභා ආඥාපනතේ 164(2) වගන්තිය අනුව නවාතැන්පලක් පවත්වාගෙන යාම සඳහා බළන්ගොඩ, දෙහිගස්තලාව, අංක 472/5 දරන ස්ථානයේ පදිංචි පී. සමන්ලාල් යන අය විසින් බලපත්‍රයක් ඉල්ලා ඇත.

02. ඉහතකී ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර නගර සභා ආඥාපනත අනුව පනවන ලද 1956.06.08 වැනි දින අංක 10939 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1952 අංක 6 දරන පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති vii කණ්ඩයේ ලැගුම්හල් පිළිබඳ උපනීති අනුව ප්‍රදේශයේ හා අවට පදිංචි සියලු දෙනාගෙන් විරෝධතා කැඳවීමට බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා වන වීරසිංහ මුදියන්සේලාගේ නිමල් ගාමිණී වීරසිංහ වන මා තීරණය කර ඇත.

03. මෙම නවාතැන්පළ සම්බන්ධයෙන් යම් අයෙක් විරුද්ධවන්නේ නම් මෙම නිවේදනය පළවූ දින සිට දින 14ක් ඇතුළත ඔබගේ විරෝධතාවය ලිඛිතව පිටපත් දෙකකින් සභාපති බළන්ගොඩ නගර සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

04. මේ සඳහා නියමිත කාලය තුළ දී ප්‍රමාණවත් විරෝධතාවයක් නොලැබුනහොත් එම ස්ථානයේ අනෙකුත් අඩුපාඩු සම්පූර්ණ කරන්නේ නම් ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලබන බව වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලැබේ.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

04-559

---

## කොළඹ මහ නගර සභාව

ගෝඝාතක ආඥා පනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම සඳහන් අය විසින් එකී නම ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයේ 2011 වර්ෂය තුළ මස් කඩ පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව කොළඹ මහ නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවී දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක

ආඥාපනතේ (272) වැනි අධිකාරිය 7(2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඔමර් කාමිල්,
විශේෂ කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

2011 අප්‍රේල් මස 04 දින,
කොළඹ 07,
කොළඹ මහ නගර සභාවේ දී ය.

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම | වෙළඳසැල් අංකය | වෙළඳ ස්වභාවය |
|---|---|---|---|
| | මාලිගාවත්ත පොදු වෙළඳපොළ | | |
| 1. | එම්.එස්.එම්.සාජහන් මයා | 09 | ගවමස් |

04-617

---

**වඩමාරච්චි දකුණ /බටහිර ප්‍රාදේශීය සභාව කරවෙඩ්ඩි**

*1975 අංක 17 දරන පනතේ කම්ටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනය*

පහත ශීර්ෂයේ සඳහන් කර ඇති පුද්ගලයා ඉඩමේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කම්ටුව 2011 වර්ෂයේ පවත්වාගෙන යාමට කම්ටු අයිතිය ලබාදෙන ලෙස ඉල්ලා ඇති බව පනතේ 06 වැනි වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

මෙම අයිතිය ලබාදීමට යෝජනා කර ඇති කම්ටුව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළ කරයි නම් *ගැසට්* නිවේදනය පළ කර ඇති දින සිට සති හතරක් ඉක්ම යාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කම්ටුවේ සභාපති ද ලේකම් ද, කලමනාකරු ද යන වග* | *කම්ටුවේ නම* | *කම්ටුව පවත්වාගෙන යාමට සුදුසු යයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| අය්යාතුරෛයි විග්නේෂ්වරන් අයිංකරාපදි තෙවරයාලි නෙල්ලිඅඩි | කලමනාකරු | අයිංගරන් විනෝදාංශ සමාජය | ප්‍රධාන වීදිය, නෙල්ලිඅඩි, කරවෙඩ්ඩි |

තී. අන්නලිංගම්,
ලේකම්.

වඩමාරච්චි දකුණ බටහිර,
ප්‍රාදේශීය සභාව,
කරවෙඩ්ඩි.
2011 පෙබරවාරි මස 24 වැනි දින,

04-589

---

# විවිධ දැන්වීම්

**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(i) යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2011 වර්ෂය සඳහා වන මෙම බද්ද වැල්ලවාය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවැනි උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2011 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි 02 වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමට වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| | | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|---|
| (1) | (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| | (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| | | *(අ)* වෙළඳ කාර්ය සඳහා යොදවනවා නම් | 18 0 |
| | | *(ආ)* වෙළඳ කාර්ය නොවන කාර්යය සඳහා යොදවනවා නම් | 04 0 |
| | (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| | (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| | (v) | සෑම රික්ෂෝවයක් සඳහා | 07 50 |
| | (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| | (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

(2) විශ්කම්භය අඟල් 26 නොයික්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යයන්හි යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

04-561/1

---

**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(iii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා ගෙවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හෝ වෙළඳ ව්‍යාපාරය ආරම්භකර මාස තුනක් ඇතුළත වෙළඳ සැල සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147(i) වගන්තිය 149, වගන්තිය හා 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පලකර ඇති අතුරු ව්‍යවස්ථා වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් වෙළඳ ව්‍යාපාර වෙනුවෙන් එම උපලේඛනයේ ii වැනි තීරුවේ ඒ එක් එක් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක වෙළඳ බලපත්‍ර ගාස්තුවක් 2011 මාර්තු මස 31 වැනි දිනට හෝ එදිනට පෙර හෝ ව්‍යාපාරය ආරම්භ කර මාස තුනක් ඉක්මවා යාමට පෙර මෙම ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍ර ලබාගත යුතු බවත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

| I වැනි තීරුව | | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1500 ඉක්මවන අවස්ථාවක |
| 01. | බේකරියක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 550 0 | 750 0 |
| 02. | තේ කෝපි කඩයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 450 0 |
| 03. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම සඳශා | 500 0 | 600 0 | 850 0 |
| 04. | සංචාරක බංගලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ලැගුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 850 0 |
| | 1. හෝටලයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| | 2. සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම සඳහා - | | | |
| | (i) දෙනුන් 05 සිට 10 දක්වා | 250 0 | 350 0 | 550 0 |
| | (ii) දෙනුන් 10 සිට දෙනුන් 25 දක්වා | 300 0 | 500 0 | 750 0 |
| | (iii) දෙනුන් 25ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා | | | |
| | 1. එක් අයෙක් සේවය කරන ස්ථානයක් සඳහා | 300 0 | 350 0 | 400 0 |
| | 2. එක් අයෙකුට වැඩියෙන් සේවය කරන ස්ථානයක් සඳහා | 400 0 | 450 0 | 750 0 |
| 08. | මිරිදිය මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 600 0 | 750 0 |
| 09. | කරදිය මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 10. | ගවමස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගවමස් හැර වෙනත් මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ගෝ ඝාතක මඩුවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නවාතැන් පොලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සිරප් හෝ පළතුරු බීම නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 600 0 | 850 0 |
| 15. | රස කැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 550 0 |
| 16. | සංචාරක අයිස්ක්‍රීම්, රස කැවිලි, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 500 0 |
| 17. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 500 0 |
| 18. | ශීතකළ මස් හෝ මාළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 550 0 | 800 0 |
| 19. | පැණි නිෂ්පාදනය කරන හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 400 0 | 550 0 |
| 20. | පළතුරු බීම හා ජෑම් නිෂ්පාදනය කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 21. | සංචාරක වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා | 200 0 | 250 0 | 300 0 |

04-561/2

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(iv) යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ 2 වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2011 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

### උපලේඛනය

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 0 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1500 0 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 450 0 |
| 02. | ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 03. | ශබ්දවාහිනී යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 400 0 |
| 04. | විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 750 0 | 1,000 0 |
| 05. | ඇඳුම් මහන ස්ථාන | | | |
| | 1. මැෂින් 01ක් සඳහා | 300 0 | 350 0 | 400 0 |
| | 2. මැෂින් 02 සිට 05 දක්වා | 350 0 | 400 0 | 450 0 |
| | 3. මැෂින් 05ට වැඩි | 400 0 | 450 0 | 550 0 |
| 06. | රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 07. | බලපත්‍ර ලත් මත්පැන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | පිඟන් බඩු, ඇලුමිනියම් බඩු, ප්ලාස්ටික් බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 400 0 | 500 0 |
| 09. | මහන මැෂින්, රූපවාහිනී යන්ත්‍ර හා ගෑස් උඳුන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 550 0 |
| 10. | රථවාහන අමතර කොටස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පාවහන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 550 0 |
| 12. | මිනීපෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 900 0 |
| 13. | හිස් ගෝනි, හිස් බෝතල්, අබලි යකඩ ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 450 0 |
| 14. | සනීපාරක්ෂක උපකරණ හා පිඟන් ගඩොල් (සියලුම ටයිල්ස්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 550 0 | 800 0 |
| 15. | ගඩොල් හෝ උළු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 500 0 | 800 0 |
| 16. | තොග වශයෙන් සිසිල්බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | බටහිර ඖෂධ වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 650 0 |
| 18. | යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 450 0 |
| 19. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 20. | තේ කුඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 350 0 |
| 21. | පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් හෝ පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 400 0 | 500 0 |
| 22. | ටයර් ටියුබ් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 450 0 | 550 0 | 600 0 |
| 23. | පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 24. | සිමෙන්ති මිටි හොන්ඩර 25කට වැඩියෙන් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 550 0 |
| 25. | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 700 0 |
| 27. | සෙලියුලර් දුරකථන විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 700 0 | 1,000 0 |
| 28. | ඛණිජ තෙල් ගැ. 50ට වඩා වැඩියෙන් ගබඩාකර නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ලිහිසි තෙල් හෝ ඛණිජ තෙල් ගැලුම් 50කට වඩා අඩුවෙන් ගබඩා කර විකිණීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 600 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 0 නොයික්මවන අවස්ථාවක* | *රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1500 0 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 30. | සිගරට් තොග වශයෙන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 31. | ලොතරැයි ටිකට්පත් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 450 0 |
| 32. | වීදුරු තොග වශයෙන් හෝ සිල්ලරට විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 450 0 | 650 0 |
| 33. | වීදුරු භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 750 0 |
| 34. | වීඩියෝ කැසට් පට අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 35. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 450 0 |
| 36. | පොත්පත්, ලිපිද්‍රව්‍ය හා පුවත්පත් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 450 0 |
| 37. | ටෙලෙක්ස්/දුරකථන පණිවිඩ සේවාවන් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 600 0 |
| 38. | කොන්ක්‍රීට් වැඩපලක් හා සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | පරිගණක අළුත්වැඩියා කිරීම හෝ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 450 0 | 800 0 |
| 41. | විකිණීම සඳහා සුරතල් මසුන් ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 200 0 | 300 0 | 400 0 |
| 42. | මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 550 0 | 800 0 |
| 43. | පැල තවාන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 500 0 |
| 44. | ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ජලනල සහ ජලනල උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 150 0 | 300 0 | 400 0 |
| 46. | විදුලි වයර් සහ ගෘහ අනෙකුත් විදුලි පරිපථ වර්ග සඳහා යොදාගන්නා සියලු විදුලි උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 650 0 |
| 47. | පොල්තෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 200 0 | 250 0 | 300 0 |
| 48. | බිම්මල් වගා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 200 0 | 300 0 | 350 0 |
| 49. | වෙළඳ සැලක් සඳහා | 250 0 | 500 0 | 750 0 |
| 50. | රත්‍රං බඩු ඔප දැමීම සහ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 550 0 |
| 51. | පාවහන් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 450 0 | 650 0 | 850 0 |
| 52. | ගෘහ භාණ්ඩ විකිණීම හෝ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 53. | ලොන්ඩරියක් සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 54. | ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ස්ථානයක් හා | 300 0 | 350 0 | 400 0 |
| 55. | ත්‍රි රෝද රථ අමතර කොටස් අලෙවි කරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 550 0 |
| 56. | රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 200 0 | 350 0 | 450 0 |
| 57. | රෙදි හා රෙදිපිළි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 58. | සාප්පු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 59. | සිල්ලර බඩු කඩයක් සඳහා | 325 0 | 450 0 | 550 0 |
| 60. | ගඩොල් හෝ උළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 500 0 | 750 0 |
| 61. | ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 62. | දැව විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 750 0 | 1,000 0 |
| 63. | සිල්ලර බඩු හා තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 750 0 |
| 64. | දර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 65. | තොග වශයෙන් ධාන්‍ය හෝ එළවලු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 550 0 | 800 0 |
| 66. | එළවලු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 400 0 |
| 67. | පළතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 400 0 |
| 68. | බුලත් පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 150 0 | 250 0 | 350 0 |
| 69. | දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 500 0 | 750 0 |
| 70. | ආයුර්වේද ඖෂධ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 650 0 |
| 71. | කොහු ඉදල්, පාපිසි නිෂ්පාදනය හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 72. | රසායනික පොහොර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 450 0 | 600 0 | 850 0 |
| 73. | කෘෂි රසායනික පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 450 0 | 550 0 | 800 0 |
| 75. | විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් | 450 0 | 650 0 | 1,000 0 |
| 76. | අත් යන්ත්‍රය මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 550 0 |

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | | රු. 750 0 නොයික්මවන අවස්ථාවක | රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක | රු. 1500 0 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 77. | රබර් ෂීට් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 550 0 | 1,000 0 |
| 78. | ශිල්පීය ක්‍රම යොදාගනිමින් (යන්ත්‍ර භාවිතා නොකරන) කලුගල් කැඩීමේ ගල්වලක් | 500 0 | 650 0 | 800 0 |
| 79. | කාර්මික කැණීම් සහිත කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | ලක්ෂා කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 550 0 |
| 81. | ගෑස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 500 0 | 800 0 |
| 82. | මෝටර් රථ වාහනවල විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 83. | කලුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | පොල්තෙල් හිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 500 0 | 750 0 |
| 85. | බැටරි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 400 0 |
| 86. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 450 0 |
| 87. | යන්ත්‍රෝපකරණ මගින් ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | කුෂන් වැඩපලක් යාම සඳහා | 350 0 | 550 0 | 800 0 |

04-561/3

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2011 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 6(v) යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා ගෙවිය යුතු ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ I වැනි උපවගන්ති ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2011 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර සඳහා බද්ද 2011 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| | I වැනි තීරුව බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | II වන තීරුව ගෙවිය යුතු බද්ද රු. ශත |
|---|---|---|
| 01. | ව්‍යාපාරයේ ආදායම රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| 02. | ව්‍යාපාරයේ ආදායම රු. 6,000 ඉක්මවන එහෙත් 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. | ව්‍යාපාරයේ ආදායම රු. 12,000 ඉක්මවන එහෙත් 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 04. | ව්‍යාපාරයේ ආදායම රු. 18,750 ඉක්මවන එහෙත් 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 05. | ව්‍යාපාරයේ ආදායම රු. 75,000 ඉක්මවන එහෙත් 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 06. | ව්‍යාපාරයේ ආදායම රු. 1,50,000 ඉක්මවන | 3,000 0 |

04-561/4

වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(vi) යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද වෙළඳ බලපත්‍ර ගාස්තුව 2011 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදා 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති 39 අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට ඇතුලත් විය යුතු අප්‍රසන්න සහ අන්තරාදායක වෙළඳාම වශයෙන් පහත උපලේඛනයේ දැක්වෙන වෙළඳාම් ප්‍රකාශයට පත් කිරීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 02 වැනි තීරුවේ සඳහන් ඒ එක් එක් වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2011 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවත් එකී වෙළඳ ව්‍යාපාරය අයත් තැනැත්තෙකු 2011 වර්ෂයේ මාර්තු මස 31 දිනට හෝ එදිනට පෙර හෝ වෙළඳ ව්‍යාපාරය ආරම්භ කර මාස තුනක් ඉක්මවා යාමට පෙර වැල්ලවාය ප්‍රාදේශීය සභාවට බලපත්‍ර ගාස්තු ගෙවා වෙළඳ බලපත්‍රය ලබාගත යුතු බවත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම***

*උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
| | | *රු. 750 0 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1500 0 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | කුකුලන් 50 ට වැඩි කුකුලන් ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 750 0 | 1,000 0 |
| 02. | ඌරන් 05කට වැඩි ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 750 0 | 1,000 0 |
| 03. | යෝගට් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 550 0 |
| 04. | ආහාර පිණිස මුදවන ලද කිරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 400 0 | 800 0 |
| 05. | අයිස්ක්‍රීම් හෝ බීම පැකට් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 350 0 | 550 0 |
| 06. | කිරි (එළගව) එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 600 0 | 850 0 |
| 07. | යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 400 0 | 500 0 |
| 08. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම සඳහා (යන්ත්‍ර භාවිතා කරන) | 450 0 | 750 0 | 1,000 0 |
| 09. | ධාන්‍ය හෝ මාංශ තොග හොන්ඩර 02ට වැඩියෙන් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 550 0 |
| 10. | යන්ත්‍රානුසාරයෙන් මිරිස්, කුලුබඩු, ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 500 0 |
| 11. | ගඩොල් හෝ වලං පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 700 0 | 1,000 0 |
| 12. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ලෝහ පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 650 0 |
| 14. | විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 300 0 | 500 0 |
| 15. | වායු සමීකරණ හෝ ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 550 0 | 1,000 0 |
| 17. | වී මෝලක් පවත්වාගෙන යාම සඳහා | 450 0 | 550 0 | 800 0 |
| 18. | විදුලි බලයෙන් ක්‍රියාකරන වී මෝලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | යන්ත්‍රෝපකරණ මගින් ක්‍රියාකරන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වැනි තීරුව<br>ව්‍යාපාරයේ ස්වභාවය | II වැනි තීරුව<br>ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>රු. 750 0 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | <br><br>රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | <br><br>රු. 1500 0 ඉක්මවන අවස්ථාවක<br>රු. ශත |
|---|---|---|---|---|
| 20. | වෙනත් ක්‍රම මගින් ක්‍රියාකරන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 300 0 | 500 0 | 600 0 |
| 21. | රටකජු පොතු ඉවත් කිරීමේ මෝලක් පවත්වාගෙන යාම සඳහා | 450 0 | 650 0 | 1,000 0 |
| 22. | මෝටර් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කෝපි, ධාන්‍ය මාංශ භෝග, කුලුබඩු ඇඹරීමේ හෝ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 550 0 |
| 24. | මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 550 0 | 800 0 |
| 25. | මෝටර් රථ අලුත්වැඩියා හා ලියවන පට්ටලයක් හා වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | විද්‍යුත් ලෝහ ආලේපන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 250 0 | 350 0 | 550 0 |
| 27. | ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 450 0 | 1,000 0 |

04-561/5

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2011 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6(viii) යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,<br>
සභාපති,<br>
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,<br>
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදා 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතුරු ව්‍යවස්ථා ඉහත (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තිය යටතේ වැල්ලවාය ප්‍රාදේශීය සභාව පිළිගෙන 1990 නොවැම්බර් 01 වැනි දින අංක 635 දරන පළාත් සභා ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකර ඇති බවත් ඉහත අංක 520/7 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති අංක 39 අතුරු ව්‍යවස්ථාවේ 02 වැනි කොටස පහත සඳහන් කරන අතර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2011 වර්ෂයට පනවා අයකළ යුතු බවත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

### *උපලේඛනය*

*අවසර පත්‍රය සඳහා අයකරන ගාස්තු ප්‍රමාණය*

| | ප්‍රචාරක දැන්වීම් විස්තරය | 2011 වර්ෂයට අවසර පත්‍රය සඳහා ගාස්තු<br>දින 01 සිට දින දින 15 දක්වා<br>රු. ශත | <br>දින 15 ට වැඩි දින 30 දක්වා<br>රු. ශත | <br>මාසයක කාලයකට වැඩි වර්ෂයක කාලයක් සඳහා<br>රු. ශත |
|---|---|---|---|---|
| 01. | බිත්තියක ප්‍රදර්ශනය කරන (චිත්‍රපටි පෙන්වීම් සම්බන්ධ නොවන) ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට | 8 0 | 18 0 | 25 0 |
| 02. | දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන (චිත්‍රපටි පෙන්වීම් සම්බන්ධ නොවන) ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට | 20 0 | 30 0 | 75 0 |
| 03. | යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවි කොට ඇති (චිත්‍රපටි පෙන්වීම් සම්බන්ධ නොවන) ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට | 9 0 | 12 0 | 25 0 |
| 04. | චිත්‍රපටි පෙන්වීම් සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට | 5 0 | 8 0 | 10 0 |
| 05. | චිත්‍රපටි පෙන්වීම් සම්බන්ධ නොවන එක් ප්‍රචාරක බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට | 15 0 | 25 0 | 40 0 |

04-561/8

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් අල්ලා නිදහස් කිරීමේ දී ගාස්තු පැනවීම

වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 6(ix) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඩබ්. ජගත් හේමන්ත,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1) හා (2) වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් මංමාවතක හෝ ඒ අවට බැඳ දිගේලි කර හෝ අයාලේ යන යම් ගවයකු, මී ගවයකු, එළුවෙකු අල්ලා නිදහස් කිරීමේ දී පහත උපලේඛනයේ 01 වැනි තීරුවේ සඳහන් කාරණය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ගාස්තු 2011 වර්ෂය සඳහා අයකළ යුතු බවත් වැල්ලවාය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

### *උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* *රු. ශත* |
|---|---|---|
| 01. | ලොකු ගවයකු හෝ මී ගවයකු අල්ලා නිදහස් කිරීමේ දී අයකරන ගාස්තුව | 2,500 0 |
| 02. | කුඩා ගවයකු හෝ කුඩා මී ගවයකු අල්ලා නිදහස් කිරීමේ දී අයකරන ගාස්තුව | 1,000 0 |
| 03. | එළුවෙකු අල්ලා නිදහස් කිරීමේ දී අයකරන ගාස්තුව | 1,000 0 |
| 04. | ගවයකු, මී ගවයෙකු, එළුවෙකු, කුඩා ගවයෙකු, මී ගවයෙකු, එළුවෙකු ගාලෙන් එක් දිනක් රඳවා තැබීමේ දී අයකරන ගාස්තුව | 200 0 |

04-561/9

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.